# දක්ඛිණ විභංගය

වැඩි විස්තර සඳහා ✆ 077 777 2556

**1** වේලාම බ්‍රාහ්මණයාගේ දානය. ❋

- රිදියෙන් පිරවූ 84,000 ක් **රන් පාත්‍ර**
- රනින් පිරවූ 84,000 ක් **රිදී පාත්‍ර**
- අමුරනින් පිරවූ 84,000 ක් **කස්ලෝ පාත්‍ර**
- ස්වර්ණාලඞකාර ඇති රන් දද ඇති රන්රසු දැලින් ගැවසුණු 84,000 ක් **ඇතුන්**
- සිංහ සම්, ව්‍යාග්‍ර සම්, දිවි සම්, පඬු ඇඹුල් ඇතිරූ රනින් අලංකාර කල රන් දද ඇති රන්රසු දැලින් ගැවසුනු 84,000 ක් **රිය**
- දුහුල් රෙදි ඇතිරූ කස්ලෝ කොසු ඇති 84,000 ක් **දෙනුන්**
- මිණි කොඩොල් පැළඳි 84,000 ක් **කන්‍යාවන්**
- කොදුපළස්, සුදු ඇතිරි, ඝන පුප් එළුලොම් ඇතිරි අතුළ කෙසෙල් මුව සමින් කල උතුම් පසතුරුණු ඇති උඩුවියන් සහිත දෙපසතැබූ කණ්වයින් ඇති 84,000 ක් **පළඟ**
- සියුම් කොමු පිළි, කොසෙය්‍ය පිළි, කම්බිලි, කපු පිළි කෝටි 84,000 ක් **වස්ත්‍ර**
- නදී මෙන් ගලන **අන්නපාන, ඛාද්‍ය, භෝජ්‍ය, ලෙහ්‍ය පෙය**

**2** එක් සෝවාන් වහන්සේනමක් වැළඳවීම. → *වේලාම බ්‍රාහ්මණයාගේ දානයට වඩා මහත්ඵලයි.*

**3** එක් සකෘදාගාමීන් වහන්සේනමක් වැළඳවීම. → *සෝවාන් වහන්සේලා සියයක් වැළඳවීමට වඩා මහත්ඵලයි.*

**4** එක් අනාගාමී වහන්සේනමක් වැළඳවීම. → *සකෘදාගාමීන් වහන්සේලා සියයක් වැළඳවීමට වඩා මහත්ඵලයි.*

**5** එක් රහතන් වහන්සේනමක් වැළඳවීම. → *අනාගාමීන් වහන්සේලා සියයක් වැළඳවීමට වඩා මහත්ඵලයි.*

**6** එක් පසේබුදුන් වහන්සේනමක් වැළඳවීම. → *රහතන් වහන්සේලා සියයක් වැළඳවීමට වඩා මහත්ඵලයි.*

**7** එක් සම්මා සම්බුදුන් වහන්සේනමක් වැළඳවීම. → *පසේබුදුන් වහන්සේලා සියයක් වැළඳවීමට වඩා මහත්ඵලයි.*

**8** සම්මා සම්බුදුන් වහන්සේ ප්‍රමුඛ භික්‍ෂු සංඝයා වැළඳවීම. → *සම්මා සම්බුදුන්වහන්සේ වැළඳවීමට වඩා මහත්ඵලයි.*

**9** සිව් දිග්හි භික්‍ෂූන් වහන්සේලා උදෙසා වෙහෙරක් කරවීම. → *ඉහත දානයට වඩා මහත්ඵලයි.*

**10** පහන් සිතින් තිසරණ සරණයාම. → *ඉහත දානයට වඩා මහත්ඵලයි.*

**11** පහන් සිතින් පංචශීල ශික්ෂා පද සමාදම් වීම. → *ඉහත පුණ්‍යකර්මයට වඩා මහත්ඵලයි.*

**12** ගඳක් සිඹිනා කාලයක් මෛත්‍රිය වැඩීම. → *ඉහත පුණ්‍යකර්මයට වඩා මහත්ඵලයි. (අර්පණා වශයෙන්)*

**13** අසුරක් ගසනා කාලයක් අනිත්‍ය මෙනෙහි කිරීම. → *ඉහත පුණ්‍යකර්මයට වඩා මහත්ඵලයි. (විදර්ශනා ඥාන)*

## පුද්ගලික වශයෙන් දියහැකි දානයන්

1. තිරිසනුන් විෂයෙහි → *සියක් අනුසස් ඇති දක්ෂිණායෙක්* ✪
2. පෘථග්ජන දුසිල්වතුන් විෂයෙහි → *දහස් අනුසස් ඇති දක්ෂිණායෙක්*
3. පෘථග්ජන සිල්වතුන් විෂයෙහි → *සිය දහසක් අනුසස් ඇති දක්ෂිණායෙක්*
4. කාමයෙහි වීතරාගී වූ බාහිරක තාපසයන් විෂයෙහි → *කෙළ ලක්ෂයක් අනුසස් ඇති දක්ෂිණායෙක්*
5. සෝවාන් ඵල පසක් කරගන්නට පිළිපන් තථාගත ශ්‍රාවකයා විෂයෙහි → *අසඞ්ඛෙය අනුසස් ඇති දක්ෂිණායෙක්*
6. සෝවාන් තථාගත ශ්‍රාවකයා විෂයෙහි → *අනන්ත අප්‍රමාණ අනුසස් ඇති දක්ෂිණායෙක් (කවර කථාද)*
7. සකෘදාගාමී ඵල පසක් කරගන්නට පිළිපන් තථාගත ශ්‍රාවකයා විෂයෙහි → "
8. සකෘදාගාමී තථාගත ශ්‍රාවකයා විෂයෙහි → "
9. අනාගාමී ඵල පසක් කරගන්නට පිළිපන් තථාගත ශ්‍රාවකයා විෂයෙහි → "
10. අනාගාමී තථාගත ශ්‍රාවකයා විෂයෙහි → "
11. රහත්ඵල පසක් කරගන්නට පිළිපන් තථාගත ශ්‍රාවකයා විෂයෙහි → "
12. අර්හත් තථාගත ශ්‍රාවකයා විෂයෙහි → "
13. ප්‍රත්‍යෙක සම්බුද්ධයන් විෂයෙහි → "
14. අර්හත් තථාගත සම්‍යක් සම්බුද්ධයන් විෂයෙහි → "

## සාංඝික වශයෙන් දියහැකි දානයන්

1. තථාගතයන් වහන්සේ ප්‍රමුඛ උභතො සංඝයා විෂයෙහි
2. තථාගතයන් වහන්සේ පිරිනිවීකල උභතො සංඝයා විෂයෙහි
3. භික්ෂු සංඝයා විෂයෙහි
4. භික්ෂුණී සංඝයා විෂයෙහි
5. ප්‍රමාණ වශයෙන් භික්ෂු සහ භික්ෂුණී සංඝයා විෂයෙහි
6. ප්‍රමාණ වශයෙන් භික්ෂු සංඝයා විෂයෙහි
7. ප්‍රමාණ වශයෙන් භික්ෂුණී සංඝයා විෂයෙහි

මූලාශ්‍ර - 2500 බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව

❋ අංගුත්තරනිකාය - 9.1.2.10 - වේලාම සූත්‍රය (පි.435)
✪ මජ්ඣිමනිකාය - 3.4.12 - දක්ඛිණවිභංග සූත්‍රය (පි.521)
✱ අංගුත්තරනිකාය - 8.1.4.7 - සප්පුරිස දාන සූත්‍රය (පි.165)
◈ අංගුත්තරනිකාය - 8.1.4.1 - දාන සූත්‍රය (පි.151)

### දාන විශුද්ධීන්ගේ ප්‍රභේද ✪

1. දුස්සීල ප්‍රතිග්‍රාහකයාට සිල්වත් දායකයා දෙන දානය - විශුද්ධ වේ.
2. සිල්වත් ප්‍රතිග්‍රාහකයාට දුස්සීල දායකයා දෙන දානය - විශුද්ධ වේ.
3. දුස්සීල ප්‍රතිග්‍රාහකයාට දුස්සීල දායකයා දෙන දානය - විශුද්ධ නොවේ.
4. සිල්වත් ප්‍රතිග්‍රාහකයාට සිල්වත් දායකයා දෙන දානය - විශුද්ධ වේ.

### සත්පුරුෂ දානය ✱

1. පිරිසිදු දෑ දෙයි.
2. ප්‍රණීත දෑ දෙයි.
3. සුදුසු කල්හි දෙයි.
4. කැපවූවක් දෙයි.
5. පරීක්‍ෂාකොට දෙයි.
6. නිරතුරු දෙයි.
7. පහන් සිතින් දෙයි.
8. දුන්පසු සතුටු වෙයි.

### අසත්පුරුෂ දානය ❋

රූක්ෂ හෝ ප්‍රණීත හෝ වේවා,
සකස් නොකොට දීම,
ගරු නොකොට දීම,
සියතින් නොදීම,
නිරතුරු නොදීම,
කම්ඵල අදහා නොදීම,

හේතුවෙන් එම දානයේ විපාක පහලවූවිට උදාර භෝජනය පිණිස, වස්ත්‍ර දැරීම, වාහන පරිහරණය පස්කම් ගුණයෙහි භෝගය පිණිස හිත නොනැමෙයි. ඔහුගේ පුත්‍රයන්, අඹුවන්, දාසයන්, මෙහෙකරු වහලුන්, කම්කරුවන්, ඔහුගේ වචන අසනු නොකැමති වෙයි. සවන් නොදෙයි.

### දාන හේතු ◈

1. වෙතට පැමිණ දෙයි.
2. බියෙන් දෙයි.
3. මට දුන්නේයයි සිතා දෙයි.
4. මට දෙන්නේයයි සිතා දෙයි.
5. දීම මැනව යැයි සිතා දෙයි.
6. මම පිසමි,මොවුහු නොපිසත්, ඒ නිසා දියයුතුයැයි සිතා දෙයි.
7. මේ දානය නිසා උපන් කීර්තියක් ලැබේ යැයි දෙයි.
8. සිතෙහි අලංකාරය පිණිස දෙයි.